# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,990 - 2016 ඔක්තෝබර් මස 21 වැනි සිකුරාදා - 2016.10.21

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## IV (අ) වැනි කොටස - පළාත් සභා

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය ... ... | — | අතුරු ව්‍යවස්ථා ... ... ... ... | — |
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... ... | — | තනතුරු ඇබෑර්තු ... ... ... ... | — |
| වෙනත් පත්කිරීම් ... ... ... ... | — | විභාග විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | — |
| පළාත් සභා නිවේදන ... ... ... ... | 1852 | ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... ... ... | — |
| | | බඩු බාහිරාදිය විකිණීම් ... ... ... ... | — |
| | | තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... | — |
| | | විවිධ දැන්වීම් ... ... ... ... | — |


*සැ. යු.* - (i) විසර්ජන (සංශෝධන) පනත් කෙටුම්පත 2016 ජූලි මස 15 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

(ii) ශ්‍රී ලංකා ඉංජිනේරුවරුන්ගේ සභාව පනත් කෙටුම්පත 2016 ජූලි මස 29 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

(iii) ශ්‍රී ලංකා තිරසාර සංවර්ධන පනත් කෙටුම්පත 2016 අගෝස්තු මස 12 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2016 නොවැම්බර් මස 11 වැනි දින පළ කරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2016 ඔක්තෝබර් මස 28 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති (*වැ. බ.*)

2016 සැප්තැම්බර් මස 15 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# පළාත් සභා නිවේදන

**වයඹ පළාතේ පළාත් සභාව**

මගේ අංකය : NWP/MORD/RD/1/16/07/
ප්‍රඥප්තිය 2015.

**මාර්ග, ප්‍රවාහන, සමුපකාර සංවර්ධන හා වෙළඳ, නිවාස හා ඉදිකිරීම්, කර්මාන්ත සහ ග්‍රාම සංවර්ධන අමාත්‍යාංශය - වයඹ පළාත**

වයඹ පළාතේ පළාත් සභාවේ 2015 අංක........දරන වයඹ ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුව පිළිබඳ ප්‍රඥප්තිය

මෙහි පහත පළකරන වයඹ පළාතේ පළාත් සභාවේ 2015 අංක.........දරන වයඹ ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුව පිළිබඳ ප්‍රඥප්තිය අද දින සිට දින තිහක් ඉකුත් වීමෙන් පසුව වයඹ පළාතේ පළාත් සභාවට ඉදිරිපත් කරන බව මෙයින් නිවේදනය කරමි. යම් අයෙකුට මෙම ප්‍රඥප්තියේ අඩංගු විධිවිධාන පිළිබඳ ඉදිරිපත් කිරීමට යම් කරුණක් ඇතොත් ඒවා එදිනට පෙර මා වෙත ඉදිරිපත් කළ යුතු වේ.

ගුණදස දෙහිගම,
මාර්ග, ප්‍රවාහන, සමුපකාර සංවර්ධන හා වෙළඳ, නිවාස හා
ඉදිකිරීම්, කර්මාන්ත සහ ග්‍රාම සංවර්ධන පළාත් අමාත්‍ය.
(වයඹ පළාත).

2016 අගෝස්තු මස 30 වැනි දින,
මාර්ග, ප්‍රවාහන, සමුපකාර සංවර්ධන හා වෙළඳ,
නිවාස හා ඉදිකිරීම්, කර්මාන්ත සහ
ග්‍රාම සංවර්ධන අමාත්‍යාංශය - වයඹ පළාත,
වයඹ පළාත් සභා සංකීර්ණය,
පතුල් මහල - කුරුණෑගල.

***වයඹ පළාතේ, පළාත් සභාවේ 2015 අංක ..............දරන ග්‍රාම සංවර්ධන ප්‍රඥප්තිය***

දීර්ඝනාමය. වයඹ පළාත තුළ ස්වශක්තියෙන් නැගී සිටින ග්‍රාමීය ජනතාවක් බිහි කිරීම සඳහාත්, ගම සමෘද්ධිමත් ජීවන මධ්‍යස්ථානයක් බවට පත් කිරීම සඳහාත්, වයඹ පළාත් ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුව පිහිටුවීම සඳහාත්, ග්‍රාම සංවර්ධන සමිති, ග්‍රාම සංවර්ධන කාන්තා සමිති, ප්‍රාදේශීය බල මණ්ඩල, දිස්ත්‍රික් බල මණ්ඩල හා පළාත් බල මණ්ඩල පිහිටුවීම, ලියාපදිංචි කිරීම හා පවත්වාගෙන යාම සඳහාත් සහ ඊට අනුෂංගික කරුණු සඳහාත් විධිවිධාන සැලැස්වීම පිණිස වූ ප්‍රඥප්තියකි.

ලුහුඬුනාමය හා ක්‍රියාත්මක වන දිනය. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ 154 උ (1) ව්‍යවස්ථාව මගින් පළාත් සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව එහි 9 වන උපලේඛනයේ 1 වන ලැයිස්තුවේ 10 වන වගන්තියේ විධිවිධාන පරිදි වයඹ පළාතේ පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ.

ප්‍රඥප්තියේ අරමුණු.

01 මෙම ප්‍රඥප්තිය වයඹ පළාතේ පළාත් සභාවේ 2015 අංක...............දරන ග්‍රාම සංවර්ධන ප්‍රඥප්තිය යනුවෙන් හඳුන්වනු ලැබේ. වයඹ පළාත් ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය ලත් දින සිට ක්‍රියාත්මක වන්නේ ය.

02 මෙම ප්‍රඥප්තියේ අරමුණු පහත සඳහන් පරිදි වේ :-

(1) ගම සමෘද්ධිමත් ජීවන මධ්‍යස්ථානයක් බවට පත් කිරීම සඳහා වැඩ සටහන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම, මෙහෙය වීම, අධීක්ෂණය කිරීම සඳහා විධිවිධාන සැලැස්වීම තුළින් වයඹ පළාතේ ජනතාවගේ ආර්ථික, සමාජීය, සංස්කෘතික හා ආධ්‍යාත්මික සංවර්ධනයක් ඇති කිරීම.

(2) වයඹ පළාත් ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුව පිහිටුවීම.

(3) ග්‍රාම සංවර්ධන සමිති, ග්‍රාම සංවර්ධන කාන්තා සමිති, ප්‍රාදේශීය බල මණ්ඩල, දිස්ත්‍රික් බල මණ්ඩල පළාත් බල මණ්ඩල පිහිටුවීම සහ ඒවා ලියාපදිංචි කිරීම, ක්‍රියාකාරිත්වය අධීක්ෂණය කිරීම, විගණනය කිරීම, ඒකාබද්ධ කිරීම, විබද්ධ කිරීම හා ඈවර කිරීම සඳහා වූ විධිවිධාන සැලැස්වීම.

*1 කොටස*

**පළාත් ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුව පිහිටුවීම එහි සංයුතිය බලතල හා කාර්යභාරය**

03 මෙම ප්‍රඥප්තියේ අරමුණු ඉටු කිරීම සඳහා වයඹ පළාත් ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුව යනුවෙන් හඳුන්වනු ලබන (මින් මතු මෙහි දෙපාර්තමේන්තුව වශයෙන් සඳහන් කරනු ලබන) දෙපාර්තමේන්තුවක් පිහිටුවිය යුතු වන්නේ ය. — දෙපාර්තමේන්තුව පිහිටුවීම.

04 මෙම දෙපාර්තමේන්තුව අවිච්ඡින්න පැවැත්මක් හා පොදු මුද්‍රාවක් ඇති ස්වකීය නාමයෙන් ග්‍රාම සංවර්ධන විෂයට අදළ සියලු කටයුතු ඉටුකිරීමට ද, නඩු පැවරීමට හා නඩු පවරනු ලැබීමට ද, වෙනත් නීති කෘත්‍යයන් සම්බන්ධයෙන් නිදහසට කරුණු කීමට ද බලය ඇති සංස්ථාපිත ආයතනයක් වන්නේ ය. — දෙපාර්තමේන්තුව නීතිගත ආයතනයක් බව.

05 මෙම දෙපාර්තමේන්තුව පළාත් අධ්‍යක්ෂක වරයෙකුගෙන්, සහකාර අධ්‍යක්ෂ වරයෙක්, දිස්ත්‍රික් නිලධාරින් දෙදෙනෙක්, ග්‍රාම සංවර්ධන නිලධාරින්, සංවර්ධන නිලධාරින් ඇතුළු සහය කාර්ය මණ්ඩලයකින් සමන්විත විය යුත්තේ ය. — නිලධාරින් පත් කිරීම.

06 දෙපාර්තමේන්තුව වෙත පැවරෙන බලතල ක්‍රියාත්මක කිරීම සඳහා වයඹ පළාත් ග්‍රාම සංවර්ධන අධ්‍යක්ෂ ලෙස ශ්‍රී ලංකා පරිපාලන සේවයේ පළමුවන පංතියේ නිලධරයෙකු විෂය භාර අමාත්‍යවරයා විමසා වයඹ පළාත් ආණ්ඩුකාරවරයා විසින් පත් කල යුතු වේ. — අධ්‍යක්ෂවරයා පත් කිරීම.

07 (1) මෙම ප්‍රඥප්තියෙහි හෝ ඊට අනුෂංගික කාරණා හෝ පනවනු ලබන නියෝග විධිවිධාන හෝ ක්‍රියාත්මක කිරීමේ බලතල අධ්‍යක්ෂකවරයා වෙත පැවරෙන්නේ ය. — පළාත් අධ්‍යක්ෂ-වරයාගේ බලතල.

(2) අධ්‍යක්ෂකවරයා විසින් අවස්ථාවෝචිත පරිදි ස්වකීය බලතල දෙපාර්තමේන්තුවේ වෙනත් නිලධාරින් වෙත පැවරිය හැක්කේ ය.

08 මෙම ප්‍රඥප්තියේ කාර්යයන් සඳහා පත් කරනු ලබන සියළු නිලධාරින් හා දණ්ඩ නීති සංග්‍රහයේ අර්ථානු කූලව රාජ්‍ය සේවකයන් වශයෙන් සැලකිය යුත්තේ ය. — රාජ්‍ය සේවක යෙක් බව.

09 වයඹ පළාත් ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුවේ කාර්යභාරය පහත සඳහන් පරිදි වේ :- — දෙපාර්තමේන්තුවේ කාර්යභාරය.

(1) ස්ව ශක්තියෙන් නැගී සිටීම සඳහා ජනතාව සංවිධානගත කිරීම.

(2) පළාත තුළ ග්‍රාම සංවර්ධනය උදෙසා වැඩසටහන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම සහ අධීක්ෂණය කිරීම.

(3) ග්‍රාම සංවර්ධන කටයුතු උදෙසා ජනතාවගේ දැනුම කුසලතා හා ආකල්ප වර්ධනය කිරීම, ව්‍යාපෘති හා පුහුණු වැඩසටහන් සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම.

(4) ග්‍රාම සංවර්ධන කාන්තා සමිති ප්‍රාදේශීය බල මණ්ඩල, දිස්ත්‍රික් බල මණ්ඩල සහ පළාත් බල මණ්ඩල, ලියාපදිංචි කිරීම ක්‍රියාකාරිත්වය අධීක්ෂණය කිරීම, විගණනය කිරීම, ඒකාබද්ධ කිරීම, විබද්ධ කිරීම සහ ඈවර කිරීම.

10. ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුවේ බලතල :

(1) වයඹ පළාත තුළ ලියාපදිංචි කර ඇති ග්‍රාම සංවර්ධන සමිති, ග්‍රාම සංවර්ධන කාන්තා සමිති ප්‍රාදේශීය බල මණ්ඩල, දිස්ත්‍රික් බල මණ්ඩල සහ පළාත් බල මණ්ඩලවල ක්‍රියාකාරිත්වය අධීක්ෂණය, ගිණුම් පරීක්ෂා කිරීම, විමර්ශනය කිරීම හා ඒ සඳහා අවශ්‍ය ලිපි ලේඛන පරීක්ෂා කිරීම සහ තොරතුරු ලබා ගැනීම ග්‍රාම සංවර්ධන අධ්‍යක්ෂකට හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියෙකුට කළ හැක්කේ ය. — දෙපාර්තමේන්තු-වේ බලතල.

*II කොටස*

**ග්‍රාම සංවර්ධන සමිති, ග්‍රාම සංවර්ධන කාන්තා සමිති පිහිටුවීම, ලියාපදිංචි කිරීම, අධීක්ෂණය කිරීම, විගණනය කිරීම, ඒකාබද්ධ කිරීම, විබද්ධ කිරීම, ලියාපදිංචිය අවලංගු කිරීම සහ සමිති විසුරුවා හැරීම**

ග්‍රාම සංවර්ධන සමිති පිහිටුවීම.

11. වයඹ පළාතේ ජනතාවගේ ආර්ථික සමාජීය හා සංස්කෘතික සංවර්ධනය සඳහා, ගමකට හෝ ග්‍රාම නිලධාරී වසමකට එක් ග්‍රාම සංවර්ධන සමිතියක් හෝ ග්‍රාම සංවර්ධන කාන්තා සමිතියක් හෝ එසේ නොවේ නම් එකී සමිති වර්ග දෙකම පිහිටුවා ගත හැකි අතර ග්‍රාම සංවර්ධන කාන්තා සමිතියක් සඳහා ස්ත්‍රී පාර්ශවය පමණක් සාමාජිකත්වය දැරිය යුතු ය. ඒ සෑම සමිතියක්ම දෙපාර්තුමේන්තුව යටතේ ලියාපදිංචි විය යුත්තේ ය.

සමිති ලියාපදිංචි කිරීම.

12. මෙම ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම ආරම්භ වන විට වයඹ පළාත තුළ ලියාපදිංචි කර ඇති ග්‍රාම සංවර්ධන කාන්තා සමිති විෂයභාර අමාත්‍යවරයා විසින් පනවනු ලබන නියෝග මගින් නියම කර ඇති ආකාරයට ලියාපදිංචිය ලබා ගත යුතු ය.

ලියාපදිංචි කිරීම සඳහා නුසුදුසුකම්.

13. (1) මෙම ප්‍රඥප්තියේ 12 වගන්තිය යටතේ පනවනු ලබන නියෝගවලින් නියම කර ඇති ප්‍රමිතීන්ට අනුකූල නොවන ග්‍රාම සංවර්ධන සමිති සහ ග්‍රාම සංවර්ධන කාන්තා සමිති ලියාපදිංචි කිරීම සඳහා සුදුසුකම් නොලබන්නේ ය.

(2) එසේ ලියාපදිංචියට සුදුසුකම් නොලබන බව අදාළ අයදුම්කරුවන් වෙත දන්වා යැවිය යුත්තේ ය.

සමිති බල ප්‍රදේශය.

14. සමිතියක බල ප්‍රදේශය ග්‍රාම නිලධාරී වසමකට වඩා පුළුල් නොවිය යුතු අතර ගමකට වඩා කුඩා නොවිය යුතුය. එසේ වුවද එක් ගමක් තුළ ආර්ථික, සමාජීය හා භූගෝලීය වශයෙන් අනන්‍යතාවයක් ඇති ගම් ගොඩැල්ලක්, යායක් හෝ වතු ඒකකයක් සඳහා එක් ගමක් තුළ සමිති කිහිපයක් වුවද පිහිටුවිය හැකි ය.

සමිති බල ප්‍රදේශ එක් සමිතියකට සීමා කිරීම.

15. එසේ වුව ද එක් සමිති බල ප්‍රදේශයක් තුළ පිහිටුවිය හැක්කේ එක් වර්ගයක එක් සමිතියක් පමණි.

ග්‍රාම සංවර්ධන සමිතියක කාර්යභාරය.

16. ග්‍රාම සංවර්ධන සමිතිවල කාර්යභාරය පහත සඳහන් පරිදි විය යුත්තේ ය.

(1) වයඹ පළාත් සභා බල ප්‍රදේශයේ වෙසෙන ජනතාවගේ ආර්ථික හා සමාජයීය තත්වයන් දියුණු කිරීම තුළින් යහපත් සමාජයක් නිර්මාණය කිරීමට අවශ්‍ය වන්නා වූ සංවර්ධන වැඩසටහන් ග්‍රාම සංවර්ධන කාන්තා සමිති මගින් විධිමත්ව ක්‍රියාත්මක කිරීම.

(2) සාමාජිකයන්ගේත්, බල ප්‍රදේශ තුළ වැසියන්ගේත්, සදාචාරය සහ සහයෝගීතාවය ඇති කර දීම සඳහා ආගමික වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, සාහිත්‍ය කටයුතු වැඩි දියුණු කිරීම, ක්‍රීඩා කටයුතු නැංවීම, ශ්‍රමදාන පැවැත්වීම ආදී කටයුතු කිරීම.

(3) මානව සම්පත් සංවර්ධනයට ප්‍රමුඛත්වය දෙමින් ගැමි ජනතාවගේ දැනුම, ආකල්ප සහ කුසලතා වර්ධනය කිරීම සඳහා දැනුවත් කිරීමේ පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

(4) ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධනය කිරීම සඳහා දායක වීම.

(5) සමිති සාමාජිකයන්ගේ ජීවන තත්වය ඉහල නැංවීම සඳහා හිතකර පරිසරයක් ගොඩ නැගීම පිණිස පවුලේ ආදායම් වියදම් කළමණාකරණය හුරු කිරීම.

(6) සමිතියේ අරමුණු සහ පරමාර්ථ ඉටුකර ගැනීම සඳහා අවශ්‍ය අරමුදල් ගොඩනගා ගැනීම.

(7) සමිති අරමුදලේ ආදායම් සහ වියදම් සඳහා නිසියාකාර විධිමත් ගිණුම් පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය පොත් පත් හා ලේඛන නඩත්තු කිරීම.

(8) සමිති සාමාජිකයන්ගේ සුභ සාධන කටයුතු පවත්වාගෙන යාම සඳහා කටයුතු කිරීම.

17. මෙම ප්‍රඥප්තියේ 12 වගන්තිය යටතේ ග්‍රාම සංවර්ධන කාන්තා සමිතියක් ලියාපදිංචි කිරීම සඳහා සුදුසුකම් නොලබන අවස්ථාවක ලියාපදිංචිය ප්‍රතික්ෂේප කළ බව ග්‍රාම සංවර්ධන අධ්‍යක්ෂවරයා විසින් ලිඛිතව දැනුම් දිය යුතු ය.

ලියාපදිංචිය ප්‍රතික්ෂේප කිරීම.

18. මෙම ප්‍රඥප්තියේ සලසා ඇති විධිවිධානවලට පටහැනිව ක්‍රියාත්මක කරනු ලබන, නියෝගවලින් නියම කර ඇති නියමයන්ට හා ප්‍රමිතීන්ට අනුකූලව කටයුතු නොකරන සහ අක්‍රියතත්වයට පත් වූ ග්‍රාම සංවර්ධන සමිති, ග්‍රාම සංවර්ධන කාන්තා සමිතිවල ලියාපදිංචිය අවලංගු කළ හැකි ය.

ලියාපදිංචිය අවලංගු කිරීම.

19. එසේ ලියාපදිංචිය අවලංගු කරනු ලැබූ සමිතියකට අයත් සියලු දේපල ග්‍රාම සංවර්ධන අමාත්‍යාංශය වෙත පැවරේ. විෂයභාර අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් නියම කරනු ලබන නිලධාරියෙකුට එම දේපල අමාත්‍යාංශය වෙනුවෙන් භාර ගෙන ආරක්ෂා කිරීමට අවශ්‍ය විධිවිධාන යෙදිය යුතු ය.

අවලංගු කරන ලද සමිති සතු දේපල.

20. මෙම ප්‍රඥප්තියේ 12 වගන්තිය යටතේ පනවනු ලබන නියෝග මගින් නියම කර ඇති ප්‍රමිතීන්ට අනුකූල නොවීම මත 13 වගන්තිවලට අනුව ලියාපදිංචි ප්‍රතික්ෂේප කිරීම සහ අවලංගු කිරීම්වලට අදළ අභියාචනා ලියාපදිංචිය ප්‍රතික්ෂේප කරන බව දන්වා යැවූ දින සිට දින 90ක් ඇතුළත ග්‍රාම සංවර්ධන විෂය භාර අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත ඉදිරිපත් කළ යුත්තේ ය. අභියාචනා සම්බන්ධයෙන් අවසන් තීරණය විෂයභාර අමාත්‍යවරයාගේ තීරණය වන්නේ ය.

අභියාචනා බලතල.

21. එක් බල ප්‍රදේශයක් තුල එක් වර්ගයක සමිති එකකට වැඩි ප්‍රමාණයක් පවතින විට අධ්‍යක්ෂකවරයාගේ තීරණයට අනුව එම සමිති ඒකාබද්ධ කළ හැකි ය./සමිති අරමුදල් ඒකාබද්ධ සමිති පොදු ගිණුමකට බැර කළ යුතු ය.

සමිති ඒකාබද්ධ කිරීම.

22. සමිති බල ප්‍රදේශ සීමාවලට පටහැනිව ග්‍රාම සංවර්ධන සමිතියක්, ග්‍රාම සංවර්ධන කාන්තා සමිතියක් පිහිටුවා ඇති විට එම සමිති විබද්ධ කොට පවත්වාගෙන යාම සුදුසු යැයි අධ්‍යක්ෂකවරයා තීරණය කරනු ලබන අවස්ථාවක සමිති විබද්ධ කිරීම කළ හැකිය. එම සමිති වල වත්කම් සමිති මහා සභාව විමසා අධ්‍යක්ෂකවරයා විසින් තීරණය කරනු ලබන ආකාරයට බෙදී යාම් කළ යුතු ය.

ආරම්භක රැස්වීම සමිති විබද්ධ කිරීම.

23. මෙම ප්‍රඥප්තියේ 12 යටතේ ලියාපදිංචි කරන ලද ග්‍රාම සංවර්ධන සමිති සහ ග්‍රාම සංවර්ධන කාන්තා සමිති මෙම වගන්තිය යටතේ විෂයභාර අමාත්‍යවරයා විසින් සාදනු ලබන නියෝග වලින් දක්වා ඇති ආකාරයට පොදු ව්‍යවස්ථාවක් යටතේ ක්‍රියාත්මක විය යුත්තේ ය.

සමිති ව්‍යවස්ථාව.

24. (1) 12 වගන්තිය යටතේ ලියාපදිංචි කරන ලද සෑම ග්‍රාම සංවර්ධන සමිතියක්, ග්‍රාම සංවර්ධන කාන්තා සමිතියක් සඳහාම අරමුදලක් පිහිටුවිය යුතු වේ.

(2) අරමුදල් කළමණාකරණයට අදාළ විධිවිධාන විෂයභාර අමාත්‍යවරයා විසින් 23 වගන්තිය යටතේ පනවනු ලබන නියෝග මගින් නියම කළ යුත්තේ ය.

සමිති අරමුදල්.

25. අක්‍රිය ග්‍රාම සංවර්ධන සමිති හා ග්‍රාම සංවර්ධන කාන්තා සමිති ප්‍රතිසංවිධානය කිරීමට අපහසු අවස්ථාවල සමිති ඈවර කිරීම කළ යුතුය. එම සමිති අරමුදල් අධ්‍යක්ෂකවරයා භාරයේ පවතින ඈවර ගිණුමකට බැර කළ යුතු ය.

සමිති විසුරුවා හැරීම.

## *III කොටස*

### ග්‍රාම සංවර්ධන ප්‍රාදේශීය බල මණ්ඩල, දිස්ත්‍රික් බල මණ්ඩල සහ පළාත් බල මණ්ඩල පිහිටුවීම, ලියාපදිංචි කිරීම හා පවත්වාගෙන යාම

26. සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයක් තුළම ග්‍රාම සංවර්ධන ප්‍රාදේශීය බල මණ්ඩලයක් පිහිටුවිය යුතු අතර එම බල මණ්ඩලය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස තුළ පිහිටුවන ලද ග්‍රාම සංවර්ධන සමිති, ග්‍රාම සංවර්ධන කාන්තා සමිතිවල සභාපතිවරුන්ගෙන්, ලේකම්වරුන් සහ භාණ්ඩාගාරික වරුන්ගෙන් සමන්විත විය යුත්තේ ය.

ග්‍රාම සංවර්ධන ප්‍රාදේශීය බල මණ්ඩල පිහිටුවීම.

ග්‍රාම සංවර්ධන ප්‍රාදේශීය බල මණ්ඩලයේ ව්‍යුහය.

27. ග්‍රාම සංවර්ධන ප්‍රාදේශීය බල මණ්ඩලයේ සභාපතිවරයා, ලේකම්වරයා සහ භාණ්ඩාගාරිකවරයා ග්‍රාම සංවර්ධන සමිති, ග්‍රාම සංවර්ධන කාන්තා සමිති සභාපතිවරුන්, ලේකම්වරුන් සහ භාණ්ඩාගාරිකවරුන් අතරින් පත් විය යුතු අතර, ප්‍රාදේශීය බල මණ්ඩලයේ උපදේශක වශයෙන් එම ප්‍රාදේශීය බල මණ්ඩලය පිහිටි කොට්ඨාසයේ ග්‍රාම සංවර්ධන නිලධාරි නිල බලයෙන් පත්විය යුතු ය. එම ප්‍රාදේශීය බල මණ්ඩලය පිහිටි කොට්ඨාසයේ ප්‍රාදේශීය ලේකම් නිල බලයෙන් අනුශාසක විය යුතු ය.

ග්‍රාම සංවර්ධන ප්‍රාදේශීය බල මණ්ඩලයේ කාර්යභාරය.

28. ප්‍රාදේශීය බල මණ්ඩල කාර්යභාරය

(1) ග්‍රාම සංවර්ධන සමිති හා ග්‍රාම සංවර්ධන කාන්තා සමිති ප්‍රවර්ධනය කිරීම සඳහා වැඩසටහන් සකස් කිරීම තුළින් එම සමිතිවල පරමාර්ථ ඉටු කර ගැනීම සඳහා මග පෙන්වීම.

(2) ග්‍රාම සංවර්ධන දිස්ත්‍රික් බල මණ්ඩල හා පළාත් බල මණ්ඩල සමඟ සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම.

(3) අධ්‍යක්ෂකවරයා විසින් ලබා දෙන උපදෙස්වලට අනුකූලව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ඒකාබද්ධ ග්‍රාම සංවර්ධන සැලැස්මක් සකස් කිරීම සඳහා සහයෝගය ලබා දීම.

(4) ග්‍රාම සංවර්ධන සමිති සහ ග්‍රාම සංවර්ධන කාන්තා සමිති අතර මනා සම්බන්ධතාවයක් ගොඩනගා ගැනීම සහ එම සමිති අරමුදල් වර්ධනය කිරීම සඳහා වැඩසටහන් සකස් කිරීම.

(5) තම බල ප්‍රදේශය තුළ ජනතාව සංවර්ධන ක්‍රියාවලිය සඳහා බලමුළු ගැන්වීමේ පුරෝගාමී මෙහෙවරක් ඉටු කිරීම.

දිස්ත්‍රික් ග්‍රාම සංවර්ධන බල මණ්ඩල පිහිටුවීම.

29. ග්‍රාම සංවර්ධන ප්‍රාදේශීය බල මණ්ඩලවල සභාපතිවරුන්, ලේකම්වරුන් සහ භාණ්ඩාගාරිකවරුන්ගේ නියෝජනයෙන් දිස්ත්‍රික් බල මණ්ඩල පිහිටුවනු ලැබේ.

දිස්ත්‍රික් ග්‍රාම සංවර්ධන බල මණ්ඩලයේ ව්‍යුහය.

30. දිස්ත්‍රික් බල මණ්ඩලයේ සභාපති, ලේකම් සහ භාණ්ඩාගාරික ප්‍රාදේශීය බල මණ්ඩලවල සාමාජිකයන් අතුරින් පත්විය යුතු අතර දිස්ත්‍රික් ග්‍රාම සංවර්ධන නිලධාරි නිල බලයෙන් උපදේශක විය යුතුය. ග්‍රාම සංවර්ධන පළාත් අධ්‍යක්ෂ නිල බලයෙන් එහි අනුශාසක වන්නේ ය.

දිස්ත්‍රික් ග්‍රාම සංවර්ධන බල මණ්ඩලයේ කාර්යභාරය.

31. දිස්ත්‍රික් බල මණ්ඩලයේ කාර්යභාරය,

(1) දිස්ත්‍රික්කය තුළ ග්‍රාම සංවර්ධන සමිති ප්‍රවර්ධනය සඳහා සහාය දීම, උපදෙස් ලබාදීම හා මග පෙන්වීම.

(2) ප්‍රාදේශීය බල මණ්ඩලවල ග්‍රාම සංවර්ධන සැලසුම් ආශ්‍රයෙන් දිස්ත්‍රික් ග්‍රාම සංවර්ධන සැලැස්ම සකස් කිරීම සඳහා දායක වීම.

(3) දිස්ත්‍රික්කයේ පවතින අනෙකුත් සංවිධාන සමඟ සහයෝගයෙන් ක්‍රියා කරමින් දිස්ත්‍රික් සංවර්ධන සැලැස්ම සකස් කිරීම සහ ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය සහාය ලබා දීම.

(4) පළාත් බල මණ්ඩලය නියෝජනය කිරීම.

ග්‍රාම සංවර්ධන පළාත් බල මණ්ඩලය පිහිටුවීම.

32. ග්‍රාම සංවර්ධන දිස්ත්‍රික් බල මණ්ඩල දෙකෙහි ම එකතුවෙන් පළාත් බල මණ්ඩලය පිහිටුවනු ලැබේ.

(1) පළාත් බල මණ්ඩලයේ සභාපති, ලේකම් සහ භාණ්ඩාගාරික දිස්ත්‍රික් බල මණ්ඩල සාමාජිකයන් අතුරින් තෝරා පත් කර ගත යුතු අතර ග්‍රාම සංවර්ධන අධ්‍යක්ෂ නිල බලයෙන් උපදේශක විය යුතු අතර ග්‍රාම සංවර්ධන විෂය භාර අමාත්‍යංශයේ ලේකම් අනුශාසක විය යුත්තේ ය.

පළාත් ග්‍රාම සංවර්ධන බල මණ්ඩලයේ කාර්යභාරය.

(2) පළාත් බල මණ්ඩලයේ කාර්යභාරය,

*(අ)* පළාත් ග්‍රාම සංවර්ධන සැලැස්ම ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය සහයෝගය ලබා දීම.

*(ආ)* ග්‍රාම සංවර්ධනයෙහි ලා අවශ්‍ය වන විශේෂ ව්‍යාපෘති හඳුනා ගැනීම, සැලසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීම සඳහා සහයෝගය ලබා දීම.

*(ඇ)* පළාතේ ග්‍රාම සංවර්ධන පුහුණු කටයුතු සහ පර්යේෂණ කටයුතු සඳහා සහය ලබා දීම.

33. මෙම ප්‍රඥප්තියේ 26,29 සහ 32 යටතේ පිහිටුවනු ලැබූ සෑම බල මණ්ඩලයක් ම ග්‍රාම සංවර්ධන පළාත් අධ්‍යක්ෂක විසින් ලියාපදිංචි කරනු ලැබිය යුතු ය. ග්‍රාම සංවර්ධන බල මණ්ඩල ලියාපදිංචි කිරීම.

34. බල මණ්ඩල ලියාපදිංචි කිරීම් සහ අවලංගු කිරීම්වලට අදාළ අභියාචනා දින 90ක් ඇතුළත ග්‍රාම සංවර්ධන විෂයභාර අමාත්‍යාංශ ලේකම්වරයා වෙත ඉදිරිපත් කළ යුතු අතර අභියාචනා සම්බන්ධයෙන් අවසාන තීරණය විෂයභාර අමාත්‍යවරයාගේ තීරණය වන්නේ ය. සමිති බලමණ්ඩල වල ලියාපදිංචිය අවලංගු කිරීම.

35. නියෝගවල දැක්වෙන ආකාරයට මෙම ප්‍රඥප්තියේ 33 යටතේ ලියාපදිංචි කරනු ලැබූ බල මණ්ඩල පොදු ව්‍යවස්ථාවක් යටතේ ලියාපදිංචි විය යුත්තේ ය. බල මණ්ඩල ව්‍යවස්ථා.

36. ලියාපදිංචි කරනු ලැබූ සෑම බල මණ්ඩලයකටම තම අරමුණු ඉටු කර ගැනීම සඳහා අරමුදලක් පිහිටුවනු ලැබිය හැකි වන්නේ ය. බල මණ්ඩල අරමුදල්.

37. මෙම අරමුදල ග්‍රාම සංවර්ධන දෙපාර්තුමේන්තු නිලධාරියෙකු විසින් විගණනය කළ යුතු වන්නේ ය. අරමුදල් විගණනය.

## *IV වන කොටස*

### වැරදි හා දණ්ඩන

38. යම් තැනැත්තෙකු,

(1) මෙම ප්‍රඥප්තිය යටතේ හෝ මෙම ප්‍රඥප්තියේ කාර්යය සඳහා හෝ මෙම ප්‍රඥප්තිය යටතේ සාදන ලද යම් නියමයක් හෝ නියෝගයක් යටතේ හෝ සාදන ලද හෝ සපයනු ලබන හෝ යම් වාර්තාවක හෝ වෙනත් ලේඛණයක් මත දැන දැනම යම් අසත්‍ය හෝ වැරදි ප්‍රකාශයක් කරන්නාවූ ද, වැරදි.

(2) මෙම ප්‍රඥප්තියෙන් නියම කර ඇති යම් තොරතුරක් හෝ වාර්තාවක් සැපයීම පැහැර හරින්නාවූ හෝ ප්‍රතික්ෂේප කරන්නාවූ ද,

(3) ග්‍රාම සංවර්ධන අධ්‍යක්ෂවරයාගේ නියෝග නිවේදන හෝ නියෝග සාධාරණ හේතුවක් නොමැතිව පැහැර හරින තැනැත්තන් ද,

(4) මෙම ප්‍රඥප්තියෙන් හෝ ඒ යටතේ නැතහොත් ඒ යටතේ සාදන ලද යම් නියෝගයක් යටතේ හෝ එමගින් යම් තැනැත්තෙකු වෙත පැවරී ඇති හෝ පවරනු ලැබ ඇති යම් බලතල කර්තව්‍ය හෝ කාර්යය ක්‍රියාත්මක කිරීමේ දී හෝ ඉටු කිරීමේ දී ඒ තැනැත්තාට අවහිර හෝ බාධා කරන්නා වූ සෑම තැනැත්තෙකුම ද,

(5) මෙම ප්‍රඥප්තියේ හෝ ඒ යටතේ සාදන ලද යම් නියෝගයක් හා විධිවිධානයක් හෝ කඩ කරන හෝ ඒ අනුව ක්‍රියාකිරීම උවමනාවෙන්ම පැහැර හරින සහ / හෝ වුවමනාවෙන්ම අවහිර කරන අයෙකු ද, මෙම ප්‍රඥප්තිය යටතේ වරදකට වරදකරු වන්නේය.

39. මෙම ප්‍රඥප්තිය යටතේ වරදක් සිදු කරනු ලැබූ විට නඩු පැවරීමේ බලය ග්‍රාම සංවර්ධන අධ්‍යක්ෂවරයා වෙත හෝ ඔහු විසින් බලය පවරනු ලැබූ නිලධරයෙකු සතු වන්නේ ය. නඩු පැවරීමේ බලය.

40. මෙම ප්‍රඥප්තිය යටතේ වරදක් සිදු කරනු ලබන සෑම තැනැත්තෙකුම මහෙස්ත්‍රාත්වරයෙකු ඉදිරියේ පවත්වනු ලබන නඩු විභාගයක දී වරදකරු කිරීමෙන් අනතුරුව, රුපියල් දසදහසක් (රුපියල් 10,000) අවමයකට හා රුපියල් ලක්ෂයකට (රුපියල් 1,00,000 නොඉක්මවන දඩයකට හෝ මාස හයක් (06) නොඉක්මවන බන්ධනාගාරගත කිරීමකට හෝ යන දෙආකාරයෙන් එක් ආකාරයක දණ්ඩනයකට හෝ එකී දණ්ඩනයන් දෙකටම හෝ යටත් කළ යුතු වන්නේ ය. දඬුවම.

මෙම ප්‍රඥප්තිය යටතේ වරදක් කරන සෑම තැනැත්තෙකුටම මහේස්ත්‍රාත්වරයෙකු ඉදිරියේ පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් වරදකරු කරනු ලබන කල්හි රු. 5000 ක දඩයකට හෝ මාස 06 කට නොවැඩි කාලයකට බන්ධනාගාරගත කිරීම හෝ එකී දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම යටත් විය යුතු ය.

*V වන කොටස*

**පොදු විධිවිධාන**

නියෝග පැනවීම.

41. මෙම ප්‍රඥප්තියේ කාරණා සම්බන්ධයෙන් නියෝග සෑදීමට විෂය භාර අමාත්‍යවරයාට බලතල ඇත්තේ ය.

අනනුකූලතාවයක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බල පැවැත් විය යුතු බව.

42. මෙම ප්‍රඥප්තියේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බල පැවැත් විය යුතු ය.

අර්ථ නිරූපනය.

43. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස මෙම ප්‍රඥප්තියේ,

"පළාත් සභාව" යන්නෙන් වයඹ පළාතේ පළාත් සභාව ද,

"විෂය භාර අමාත්‍යවරයා" යන්නෙන් ග්‍රාම සංවර්ධන විෂය භාර අමාත්‍යවරයා ද,

"ලේකම්වරයා" යන්නෙන් වයඹ පළාත් සභාවේ ග්‍රාම සංවර්ධන විෂය භාර අමාත්‍යාංශයේ ලේකම්වරයා ද,

"පළාත් ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුව" යන්නෙන් ග්‍රාම සංවර්ධන විෂය සඳහා පිහිටුවනු ලබන දෙපාර්තමේන්තුව ද,

"අධ්‍යක්ෂවරයා" යන්නෙන් වයඹ පළාත් සභාවේ ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුවේ පළාත් අධ්‍යක්ෂවරයා ද,

"නිලධාරියා" යන්නෙන් වයඹ පළාත් සභාවේ ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුවේ ග්‍රාම සංවර්ධන නිලධාරීන්, සංවර්ධන නිලධාරින් (ග්‍රාම සංවර්ධන), මැහුම් උපදේශිකාවන් හා අනෙකුත් නිළධාරීන් ද,

"ග්‍රාම සංවර්ධන සමිති" යන්නෙන් ග්‍රාම සංවර්ධන සමිති හා ග්‍රාම සංවර්ධන කාන්තා සමිති ද,

"සමිතියක බල ප්‍රදේශය" යන්නෙන් ග්‍රාම නිලධාරි වසමකට වඩා පුළුල් නොවිය යුතු වන්න ද,

"ප්‍රාදේශීය බල මණ්ඩල" යන්නෙන් වයඹ පළාත තුල එක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකට එක බැගින් ලියාපදිංචි කළ ප්‍රාදේශීය ග්‍රාම සංවර්ධන බල මණ්ඩල ද,

"දිස්ත්‍රික් බල මණ්ඩල" යන්නෙන් වයඹ පළාත තුල කුරුණෑගල හා පුත්තලම දිස්ත්‍රික්ක දෙකට එක බැගින් ලියාපදිංචි කල දිස්ත්‍රික් ග්‍රාම සංවර්ධන බල මණ්ඩල ද,

"පළාත් බල මණ්ඩල" යන්නෙන් ලියාපදිංචි කළ වයඹ පළාත් ග්‍රාම සංවර්ධන බල මණ්ඩලය ද,

"සමාජිකයා" යන්නෙන් ග්‍රාම සංවර්ධන සමිති වන විට එක් එක් සමාජිකයින්ද ප්‍රාදේශීය බල මණ්ඩල වන විට ග්‍රාම සංවර්ධන සමිතිද, දිස්ත්‍රික් බල මණ්ඩල වන විට ප්‍රාදේශීය බල මණ්ඩල ද, පළාත් බල මණ්ඩල වන විට දිස්ත්‍රික් බල මණ්ඩල නියෝජනය කරන ප්‍රාදේශීය බල මණ්ඩල ද,

"ව්‍යවස්ථාව" යන්නෙන් මෙම ප්‍රඥප්තිය යටතේ සාදන ලද රීති යටතේ පිහිටුවන ලද ග්‍රාම සංවර්ධන සමිති, ග්‍රාම සංවර්ධන කාන්තා සමිති සහ බල මණ්ඩලවල අනුමත කරන ලද ව්‍යවස්ථා ද,

"නියෝග" යන්නෙන් මෙම ප්‍රඥප්තියේ විධිවිධාන වලට යටත්ව සාදන ලද නියෝග අදහස් වේ.

10-481

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.